උපන් බිමෙන් ඈත විදේශයක සාර්ථක ව්‍යාපාරයක් හා සේවාවක් පවත්වාගෙන යාමට ශක්තිය ඇති ශ්‍රී ලාංකිකයන් විරලය. එවන් ව්‍යාපාරිකයන් අපට ආඩම්බරයකි. මව්බිමට ශක්තියකි.

අද දිරිය දෑත් තුලින් අප හමුවන්නේ ඔස්ට්‍රේලියාවේ වෘත්තිය අධ්‍යාපන ආයතනයතන අතර ඉතා ඉහළ පිළිගැනීමක් ඇති ඔස්ට්‍රේලියන් එඩියුකේෂන් ඇකඩමි ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි හා විදුහල්පති ඩිල්ෂාන් ප්‍රනාන්දු මහතා යි.

මේ අප ඔහු සමග කළ පිළිසඳරයි.

*ඔබ ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ හැටි ගැන කතා කරමුද?*

අපි ඔස්ට්‍රේලියාවට ආවෙ 1982 දී. ඔස්ට්‍රේලියාවට එන්න මූලික සුදුසු කම වුනේ මගේ පියා වෘත්තිය ක්‍රිකට් ක්‍රීඩකයකු වීමයි. ඔහුගේ සුදුසුකම් මත අපට ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට ලැබුණා.

**අපි ඉදිරියේ දී මෙම ආයතනය තවත් විශාල කිරීමට බලාපොරොත්තු වෙනවා. දැනට ඒ සඳහා අපට රජයේ අනුමැතිය ලැබී තිබෙනවා. ළබන වසර වන විට ළමයි 1340 දක්වා වැඩි කිරීමට අපට අවසර ලැබී තිබෙනවා. දැනට මේ ආයනගේ ගුරුවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය 51 දෙනෙක් සිටිනවා. එයින් 71% ක් ශ්‍රී ලාංකිකයන් වීම මා ලැබූ තවත් ජයග්‍රහණයකි.**



# මගේ එකම අරමුණ උසස් තත්වයෙන් යුත් වෘත්තීය අධ්‍යාපනයක් මගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දීම - ඩිල්ෂාන් ප්‍රනාන්දු

ශ්‍රීනාත් මද්දුමගේ

*ඔබේ බාල කාලය ගැන*

මම මුලින්ම පාසල් ගියේ මීගමුවේ මාරිස්ටෙලා විදුහලටයි. ඉන් අනතුරුව මොනෑෂ් විශ්ව විද්‍යාලයෙන් බීඑස්සී උපාධිය හා මෙල්බන් විශ්ව විද්‍යාලයේ ඇකඩමි ඔෆ් සයන්ස් ආයතනයෙන් උපාධි ලබා ගත්තා. මගේ සහෝදරයා හා සහෝදරියත් ටිරෝන් ප්‍රනාන්දු හා මරිනා ප්‍රනාන්දු ද උසස් අධ්‍යාපනය හැදෑරුවා. මගේ වැඩිමල් සොහොයුරා පර්ත් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයකු ලෙස සේවය කරනවා.

*ඔබේ මුල්ම වෘත්තිය?*




මම මුලින්ම ඔස්ට්‍රේලියාවේ පාසල් කීපයකම ළමුන්ට විද්‍යා විෂයයන් ඉගැන්නුවා. වෙස්ට්බර්න් ග්‍රැමර් පාසලේ හා වෙරබි මැකිලොප් ග්‍රැමර් පාසලේ විද්‍යා අංශ ප්‍රධානියා ලෙස මම සේවය කළා. එහිදී වැඩිපුර ඉගැන්වීම් කටයුතු කළේ වසර 11 හා 12 පන්තිවල සිසුන්ට.

*ඔබේ ව්‍යාපාරයක් ලෙස මේ ඇකඩමිය ආරම්භ කළ හැටි අපට කියන්න පුලුවන්ද*

අවුරුදු 18 පමණ මම ගුරු වෘත්තියේ නියැලී හිටියා. ඒ අතරෙදි මට හිතුණා මගේම අධ්‍යාපන ආයතනයක් ආරම්බ කරන්නට. මේ අනුව තමයි ඒඊඒ ඇකඩමිය ආරම්භ කළේ. 2003 වසරේදී මූලික වශයෙන් මෙහි සිදුවුණේ උපකාරක පන්ති පැවැත්වීමයි. 2004 වදරේදී තමයි ඇකඩමියක් ලෙස ආරම්භ කරන්නට වීආර්කිව්වී ආයතනයෙන් අපට අවසර ලැබුණේ. 2004 වසරේ ආරම්භ කරන විට ඇකඩමියේ හිටියේ එක ළමයයි. 2005 වනවිට ළමුන් 12 දක්වා වැඩි වුනා. 2006 වන විට 38 දක්වාත් ඒ වසරේම අග භාගය වන විට ළමයි 182 දක්වාත් ඉහළ ගියා. දැන් මෙහි ළමයි 550 ක් ඉගෙනුම ළබනවා.

*දැනට මේ ආයතනයේ මොන වගේ පාඨමාලා ද පවත්වන්නෙ?*

ව්‍යාපාර කළමණාකරණය, රූපලාවන්‍ය, සමාජ සුබසාධන පාඨමාලා පැවැත්වෙනවා.

*ඉදිරි අනාගත සැළසුම්*

අපි ඉදිරියේ දී මෙම ආයතනය තවත් විශාල කිරීමට බලාපොරොත්තු වෙනවා. දැනට ඒ සඳහා අපට රජයේ අනුමැතිය ලැබී තිබෙනවා. ළබන වසර වන විට ළමයි 1340 දක්වා වැඩි කිරීමට අපට අවසර ලැබී තිබෙනවා. දැනට මේ ආයනගේ ගුරුවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය 51 දෙනෙක් සිටිනවා. එයින් 71% ක් ශ්‍රී ලාංකිකයන් වීම මා ලැබූ තවත් ජයග්‍රහණයකි. මේ ආයතනය ආරම්භ කරනකොට මගේ සිතේ තිබුණ තවත් බලාපොරොත්තුවක් තමයි ශ්‍රී ලාංකිකයන් වන අපේ සහෝදර සහෝදරියනට හැකි තරම් රැකියා අවස්ථා ලබා දීමත් ශ්‍රී ලංකාවෙන් අධ්‍යාපනය සඳහා පැමිණෙන සිසුන්ට නිසා ආකාරව පහසුකම් සහිතව තමන්ට හුරු පුරුදු පරිසරයක අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවස්ථාව සැළසීමත්.

*මේ ඇකඩමිය මෙල්බන් නුවරට පමණක් සීමා වූවක් ද?*

නෑ.. මගේ බලාපොරොත්තුවක් තිබෙනවා මෙල්බන් නගරයෙන් පිට අනෙක් ප්‍රාන්ත වලත් මේ ආයතනයේ පීඨ ආරම්භ කිරීමට. එහි පළමු පීඨය සිඩ්නි නගරයේ ආරම්භ කිරීමට අදහස් කර සිටිනවා.

*ඉදිරියේදීත් ඔබ අලුත් පාඨමාලා ආරම්භකිරීමට බලාපොරොත්තු වෙනවද?*

ඔව්.. ඉදිරියේදී තවත් පාඨමාලා රැසක් ආරම්භ කරන්නට අපි සැළසුම් කර තිබෙනවා. Community Welfare, Hairdressing,

28 වන පිටුවට

